# අභිමි වූ විශ්‍රාන්තිය සොයා

එම්.පී.ටී මාරසිංහ

වර්ෂ 1988 සෝමරත්න බාලසූරිය මහතා විසින් රචිත '' වප් මඟුල'' නම් කෙටි නවකතාව අත්දැකීම් හා යාබද සමාජය කලක් අධ්‍යයනය කිරීමෙන් පසුව රචනා කොට ඇත. අම්පාර ප්‍රදේශයේ නියඟයෙන් පීඩාවට පත් පිරිසකගේ ජීවන කතාවත් වැසි වසින තුරු ඇසිපිය නොහෙලා බලා ඉඳ ජීවිතය තිර කර ගැනීමට දරන්නා වූ උද්සාහයත් ඒ අතරතුර ලැබෙන කුඩා විවේක කාලයේ ඔවුන් තමාගේ විශ්‍රාන්තිමය ක්‍රියාකාරකම් මෙහි සඳහන් කොට ඇත. සමාජීය සත්වයෙකු ලෙස මිනිසාට විශ්‍රාන්තිමය ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය බව සනාථ කොට ඇත.
'' නොයෙකුත් විහිළු තහළු කරමින් ද කටකතා ලුණු ඇඹුල් එකතු කර කියමින් ද, තියන හැටියට කොස් ගෙඩියක්, දෙල් ගෙඩියක්, මඤ්ඤොක්කා අලයක් තම්බා ගෙන කෑමෙන් ද වතුර ඉනූ ළිඳෙන්ම නා හදා ගෙන ඒ මෙන් ද මේ කාලය.... ,කොල්ලෝද පාසල් නොගොස් වැඩ බලාපොරොත්තුවෙන් වැව් පිටියට වී සෙල්ලම් කරමින් සිටියේ ය..., තොරතෝංචියක් නොමැතිව එකිනෙකට සම්බන්ධ නැති නොයෙකුත් කතා බහ කරමින් ද, ඕපාදූප කියමින් ද බුලත් හපමින්ද කල් ...., වැව් පිටියට රැස්ව බෝල ගැසීම හෝ ගුඩු පැනීම පුරුද්දක් කර ගත් හ...., ඉවත දමන ගැල්වනයිස් කම්බි කැලි සෑම ගෙදරකම පාහේ දක්නට ලැබිණි. ළමෝ ළපටි තම සෙල්ලම් කරත්ත වල ඒවා ඒරියල් හැටියට...., නොයෙකුත් උපකරණ දක්වමින් කියන කතා ඇසීමට ඔවුහු ප්‍රිය කළහ....
බොහෝ රෑ බෝ වී වෑ කන්ද දිගේ සී පදයක් කියමින්... ළමෝ ළපටි ජල පහරට පැන පීනා ලිස්සා යමින් පෙරළමින් නාන්නට වූවෝය..., තරුණියන් දියබුං ගසමින් නා හදා ගෙන වෙනදා පසු නොවූ උද්ධාමයකින් තෙත් වූ වරලස උරහිස් මතින් දමා ගනිමින්.... කම්කරුවෝ කඩයෙන් අඩියක් ගසා මස් මාළු සහිත කෑම වේලක් ගැනීමට ප්‍රිය මනාප වූහ....., ගමේ ගෙදරකට එකතු වී කාඩ් සෙල්ලම් කිරීම කතා බහ කර කර සිටීම තබා වෑ කන්ද උඩ පැය භාගයක් ගෙවීමෙන් ද..., ගැහැණු ජෙමා මල්ලිගේ කඩයට ටීවී බලන්න ඇදුනහ...ඇත්ත වශයෙන් ම සවස් ජාමයේ ද ගමේ ගෙවල් දොරවල් වැසී තිබුණි...,
වෑ කන්ද අසල තැනෙන වේදිකාව වැඩ ඇරීමෙන් පසුව ප්‍රීතියෙන් රූපවාහිනිය නරඹා පිරිස් ආදිය උප ශීර්ෂ යටතේ..., හිස් ටින් බෙලෙක්ක හා තල කොල යොදා ගෙන ඊට සමාන සෙල්ලම් උපකරණ සාදා මිදුල්වල සවි කිරීමට පටන් ගත්තේ ය... නා හදා ගත් අපි හොරොව්ව අසල කඳු බැවුමේ වාඩි වී කතා බහ කරමින්...., ඇතැමෙකුගේ කතා බහ සිනා කවටකම් වලින් ඔවුන් පොඩි අඩියක් ගසා ...., පාට පාට කොළ කැබලි, ලණු කැලි , ඉටි කොළ තැනින් තැන ළමුන් කිහිප දෙනෙකු එකතු කරමින් සිනා වෙමින් කාලය ගත කළේ ය.

බාලසූරිය, සෝමරත්න (1986), වප්මඟුල,